# බුද්ධභාෂිතයේ ප්‍රාමාණිකත්වය (විඥාවාදී සිද්ධාන්ත ඇසුරින් කෙරෙන විමර්ශනයක්)

එස්. ඒ. පී. විජේසිංහ

බුද්ධභාෂිතයේ යථාර්ථය කුමක්දැයි නිරීක්ෂණය කිරීම ඓතිහාසික වශයෙන් දෙවෙනි ධර්මසංගීතිය තෙක් විහිදී යන පෞරාණිකත්වයක් පෙන්වයි. මාර්ගසත්‍යාවබෝධයෙන් ලබන අර්හත්භාවය පිළිබඳ තත්කාලීන ශ්‍රාවක ස්ථවිරවරුන් අතර පැවති එකමතික නොවූ පිළිගැනීමට අනුව අපට පැහැදිලි වන්නේ බුද්ධභාෂිතයේ යථාර්ථයත් ධර්මවර්ණයත් විවිධ විපර්යාසයනට බුද්ධ පරිනිර්වාණයෙන් වැඩි කලක් නොගොස්ම පත්ව තිබුණු බවයි. පළමුවරට ඒකීය භික්ෂු සමාජයෙන් මහාසංඝික නමින් කොටසක් වෙන්ව ගිලිහී ගියේ මෙසේ බුද්ධ භාෂිතයේත් ධර්මවර්ණයේත් ඒකමතික බවක් ඔවුන් අතරේ නොවූ හෙයිනැයි පෙනෙයි. මේ බෙදීම තෙවෙනි සංගායනාවස්ථාව වන විට අටළොස් නිකාය දක්වා වර්ධනය වී තිබුණු බවද පෙනෙයි. මෙසේ එකම ශ්‍රාවක සංඝ සමාජය පසු කාලයක විවිධාකාරයෙන් වෙන් වී සිටිමින් සාම්ප්‍රදායික ස්වකීය දෘෂ්ටිමතිමතාන්තරයන්හිම එල්බගෙන තම ගුරුකුලයේ මතය මේ යැයි ප්‍රකාශ කිරීමට පැරසී කැමතිව සිටි බවක් ද පෙනෙයි. මහායානයේ සම්භවයට හේතු අත වූ ඓතිහාසික පසුබිම අප විසින් දැකිය යුතුව ඇත්තේ නිකායයන්ගේ හෙවත් ශ්‍රාවක සම්ප්‍රදායන්ගේ මෙකී විකාශනය තුළින් ය. තම තමන්ට වැටහෙන ආකාරයෙන් බුද්ධභාෂිතයේ යථාර්ථය පැහැදිලි කිරීමට උත්සාහ ගෙන තිබීම හීනයානික හා මහායානික ධර්මග්‍රන්ථයන්හි ඉතා සරලව හා සුලභව දැකිය හැකි ලක්ෂණයකි. හීනයානික ධර්මයෙහි සත්‍යය යනු, වචනා ගත සූත්‍ර, ස්වරූපයෙන් නිර්දේශ කරනු ලැබ ඇති අතර බොහෝ මහායානික සූත්‍රයන්හි සත්‍යය යනු වචනා ගනිමින් ම ප්‍රායෝගිකව හැසිරිය යුතු ස්වරූපයෙන් නිර්දේශ කර තිබෙනු පෙනෙයි. එහෙයින් මහායානික ධර්ම වර්ණය ජීවිතයට ප්‍රායෝගිකව වඩාත් ළං වී තිබේ යැයි කිව හැකිය. එක් සම්ප්‍රදායක් විසින් පෙන්වනු ලබන බුද්ධභාෂිතයේ යථාර්ථය අනෙක් සම්ප්‍රදායක් විසින් ප්‍රතික්ෂේප කොට එය එසේ නොව මෙසේ යැයි පෙන්වීම ශාසන ඉතිහාසයෙන්